පේරාදෙණිය විශ්වවිද්‍යාලය
பேராதனைப் பல்கலைக்கழகம்
UNIVERSITY OF PERADENIYA

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
தொடர் தொலைக் கல்வி நிலையம்
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - 2016 අගෝස්තු
GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) – AUGUST 2016

# ආර්ථික විද්‍යාව I – (ECG 1)

- මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව 10 කි
- එක් කොටසකින් අඩු තරමින් ප්‍රශ්න දෙකක්වත් තෝරා ගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න
- කාලය පැය **තුනයි**
- ප්‍රස්ථාර කොළ සපයනු ලැබේ. ගණක යන්ත්‍ර භාවිතා කල හැක

---

## I වන කොටස

1. උපයෝගිතා-උපරිමකරණ පාරිභෝජකයෙකුගේ උපයෝගිතා ශ්‍රිතය $U(X,Y) = X^{0.5}Y^{0.5}$ ලෙස දැක්වේ. X සහ Y මගින් පාරිභෝජනය කරනු ලබන භාණ්ඩ ප්‍රමාණයන්ද, Px සහ Py මගින් පිළිවෙලින් ඒවායෙහි ඒකකයක මිල, M මගින් පාරිභෝගික ආදායමද දැක්වේ.

   i. ආදායම් සංරෝධකයට යටත්ව පාරිභෝගිකයාගේ අරමුණු ශ්‍රිතය ලියන්න (ලකුණු 03)

   ii. X භාණ්ඩයෙහි මිල රු 0.25 ක්ද Y භාණ්ඩයෙහි මිල රු 1 ක්ද, මුළු ආදායම රු 2 ක්ද ලෙස සලකා ආදායම් සංරෝධක සමීකරණය දක්වන්න (ලකුණු 02)

   iii. ලග්රාන්ජියන් ශ්‍රිතය (Lagrangian function) පිහිටුවන්න (ලකුණු 05)

   iv. X සහ Y භාණ්ඩවල ප්‍රශස්ථ ප්‍රමාණයන් මොනවාද? (ලකුණු 05)

   v. සමතුලිතතාවයේදී ඉහත පාරිභෝගිකයාගේ මුළු උපයෝගිතාව ලබාගන්න (ලකුණු 05)

2. i. පාරිභෝගික ඉල්ලුම් න්‍යායට අදල වන උපයෝගිතා ප්‍රවේශය හා උපේක්ෂා වක්‍ර ප්‍රවේශය අතර සම්බන්ධතාව පැහැදිලි කරන්න (ලකුණු 10)

   ii. මෙයින් කුමන ප්‍රවේශය වඩාත් යෝග්‍ය වන්නේද? ඒ ඇයි? (ලකුණු 05)

   iii. ඉහත එක් ප්‍රවේශයක් භාවිතාකරමින් ඔබ ඉල්ලුම් වක්‍රයක් ව්‍යුත්පන්න කරන්නේ කෙසේද? (ලකුණු 05)

3. i. "නිෂ්පාදන ශ්‍රිතය" යන්නෙහි හරය ඔබ විස්තර කරන්නේ කෙසේද? (ලකුණු 05)

   ii. ආයතනයක නිෂ්පාදන ශ්‍රිතය පහත සමීකරණය මගින් දී ඇතැයි සිතන්න. $Q = f(L,K) = 4LK - 3L^2 - 2K^2 + 6K + 14K$ එහි Q මගින් නිෂ්පාදන ප්‍රමාණයද K සහ L මගින් පිළිවෙලින් භාවිතා කරනු ලබන ප්‍රාග්ධන ප්‍රමාණය හා ශ්‍රම ප්‍රමාණය දක්වයි.

   a. ආයතනයෙහි නිෂ්පාදන මට්ටමට උපරිම කරන ප්‍රාග්ධන සහ ශ්‍රම ප්‍රමාණයන් සොයන්න (ලකුණු 07)

   b. මෙම ආයතනය පූර්ණ තරඟකාරී නම් සහ එහි නිෂ්පාදන ඒකකයක් රු 25 ලෙස අලෙවි කරයි නම් ලාභ උපරිම කරන ප්‍රාග්ධන හා ශ්‍රම ප්‍රමාණයන් මොනවාද? (ආයතනය ශ්‍රමය සහ ප්‍රාග්ධන ඒකකයක් සඳහා මිලයන් ලෙස පිළිවෙලින් රු. 7/= ක සහ රු. 14/= ක ගෙවීමක් කරන බව උපකල්පනය කරන්න) (ලකුණු 08)

4. i. ආයතනයක සමතුලිතතාව යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? පූර්ණ තරගකාරී සහ ඒකාධිකාරී තත්වයන් යටතේ ආයතනයනවල කෙටිකාලීන සහ දිගුකාලීන සමතුලිතතාව සඳහා වන කොන්දේසි පැහැදිලි කරන්න (ලකුණු 10)

ii. "ඒකාධිකාරය සම්පත් අනිසි ලෙස බෙදාහැරීමකට හේතුවන අතර එය සමාජ ශුභ සාධනය පහල යාමකට හේතුවේ." මෙම ප්‍රකාශය පිළිබඳ විවේචනාත්මක ඇගයීමක් කරන්න. (ලකුණු 10)

5. පහත දැක්වෙන ඒවා පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i. ආයතනයක ආන්තික නිෂ්පාදනය සහ සාමාන්‍ය නිෂ්පාදනය
ii. රජය විසින් පනවනු ලබන උපරිම මිල සහ අවම මිලයන්හි අරමුණු
iii. පාරිභෝගික අතිරික්තය සහ නිෂ්පාදක අතිරික්තය
iv කොබ් ඩග්ලස් (Cobb-Douglas) නිෂ්පාදන ශ්‍රිතය

(කොටසකට ලකුණු 05 බැගින්)

## II වන කොටස

6. i. පාරිභෝජන වියදම් වැඩිවීම පහත දෑ සඳහා බලපෑ හැකි ආකාරය කෙටියෙන් ලියන්න

a. ආයෝජන (ලකුණු 02)
b. උද්ධමනය (ලකුණු 02)
c. සේවා නියුක්තිය (ලකුණු 02)

ii. විවෘත ආර්ථික ආදර්ශයක් සම්බන්ධයෙන් පහත දැක්වෙන තොරතුරු සලකන්න. (වටිනාකම් රු. මිලියනවලිනි)

$$C = 300 + 0.8Y_d\ ;\ I = 50\ ;\ G = 50;\ T = 20\ ;\ TR = 20$$

$$X = 100\ ;\ M = 20 + 0.2Y$$

Y = ජාතික ආදායම; $Y_d$ = වැයකල හැකි ආදායම; C = පරිභෝජනය; T= බදු
G = රජයේ වියදම; TR = සංක්‍රාම; I = පෞද්ගලික ආයෝජන; X= අපනයන;
M = ආනයන

a. සමතුලිත ජාතික ආදායම ගණනය කරන්න (ලකුණු 04)
b. සමතුලිත ජාතික ආදායමේදී පරිභෝජන වියදම ගණනය කරන්න (ලකුණු 05)
c. පෞද්ගලික ආයෝජන රු. මිලියන 10 කින් වැඩි වූයේ යැයි සිතන්න. නව සමතුලිත ජාතික ආදායම ගණනය කරන්න (ලකුණු 05)

7. "මූල්‍ය ප්‍රතිපත්තිවල සඵල බව රඳාපවතින්නේ මුදල් සඳහා ඉල්ලුමෙහි සහ ආයෝජන සඳහා ඉල්ලුමෙහි පොලී නම්‍යතාව මතය". ඔබ එකඟවන්නේද? හේතු දක්වන්න. ආර්ථිකයක පෞද්ගලික අංශයේ වියදම් තීරණ සඳහා මූල්‍ය ප්‍රතිපත්ති බලපානු ලබන අනෙකුත් මාර්ග මොනවාද ? (ලකුණු 20)

8. i. පිලිප්ස් වක්‍රය මගින් පෙන්නුම් කරන්නේ කුමක්ද? (ලකුණු 04)
ii. සේවා වියුක්තිය සඳහා හේතු සහ එහි ප්‍රතිවිපාක කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 08)
iii. ව්‍යුහාත්මක සහ සාර්ගික සේවා වියුක්තිය අතර වෙනස දක්වන්න. (ලකුණු 08)

9. i. ගෙවුම් ශේෂයෙහි හිඟය යන සංකල්පය පැහැදිලි කරන්න (ලකුණු 08)

ii. රටක ගෙවුම් ශේෂයෙහි අසමතුලිතතාවන් සඳහා වන කෙටිකාලීන සහ දිගුකාලීන විසඳුම් පිළිබඳ විවේචනාත්මක විශ්ලේෂණයක් කරන්න. (ලකුණු 12)

10. පහත දැක්වෙන ඒවා පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i. විවෘත ආර්ථිකයක විනිමය අනුපාතිකය තීරණයවීම සඳහා බලපාන සාධක

ii. මුදල් අවප්‍රමාණය කිරීම සහ ක්ෂයවීම

iii. මූල්‍ය ප්‍රතිපත්තිවල අරමුණු

iv. ද්‍රවශීලතා පාශය (Liquidity Trap)

(කොටසකට ලකුණු 05 බැගින්)

******************************

**පේරාදෙණිය විශ්වවිද්‍යාලය**
**பேராதனைப் பல்கலைக்கழகம்**
**UNIVERSITY OF PERADENIYA**

**දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**
**தொடர் தொலைக் கல்வி நிலையம்**
**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION**

## ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - 2016 අගෝස්තු
## GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) – AUGUST 2016

## ( ECG 2)- Economics II

- මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව 08 කි
- ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න
- එක් එක් ප්‍රශනයට ලකුණු ලබාදීම පෙන්නුම් කර ඇති පරිදිවේ
- කාලය - පැය තුනයි

1. (i) 'වැඩවසම් ක්‍රමය' යන්නෙන් ඔබට හැඟෙන්නේ කුමක්ද? (ලකුණු 04)

   (ii) බටහිර යුරෝපයේ වැඩවසම් ක්‍රමයෙහි ප්‍රධාන ලක්ෂණ මොනවාද? (ලකුණු 06)

   (iii) බටහිර යුරෝපයේ එහි බිඳවැටීමේ ක්‍රියාවලිය පැහැදිලි කරන්න (ලකුණු 10)

2. 'කාර්මික විප්ලවය' යන්නෙන් ක්ෂණික වෙනස්වීමක් අදහස් නොකරන නමුත් එය අවසාන වශයෙන් රටක ආර්ථිකයේ මූලික ගති ලක්ෂණවල සිදුවන වෙනසක් බව අදහස් කරයි. 18 සහ 19 වන ශත වර්ෂවලදී මහා බ්‍රිතාන්‍යයේ සිදුවූ කාර්මීකරණ වෙනස්වීම් පාදක කොටගනිමින් මෙම ප්‍රකාශය පිළිබඳව සාකච්ඡාකර අදහස් දක්වන්න. (ලකුණු 20)

3. 19 වන ශත වර්ෂයේ යුරෝපයේ ඕනෑම රටක කාර්මික සංවර්ධනය සඳහා කෘෂිකාර්මික පරිවර්තනයේ කාර්යභාරය සාකච්ඡා කරන්න. (ලකුණු 20)

4. 19 වන ශත වර්ෂයේ මහා බ්‍රිතාන්‍යයේ සහ ජර්මනියේ ආර්ථික වෘද්ධි ක්‍රියාවලිය තුළ හඳුනාගත හැකි සමානකම් සහ වෙනස්කම් මොනවාද? (ලකුණු 20)

5. 19 වන ශත වර්ෂයේදී ප්‍රංශයේ සිදුවූ ප්‍රධාන ජනවිද්‍යාත්මක වෙනස්වීම් විස්තර කොට එරට කාර්මික සංවර්ධනය කෙරෙහි ඒවා බලපෑ ආකාරය විස්තර කරන්න. (ලකුණු 20)

6. 18 සහ 19 වන ශත වර්ෂවලදී මහා බ්‍රිතාන්‍යයේ සහ ජර්මනියෙහි ආර්ථික සංවර්ධනය ක්‍රියාවලිය තුළ රජයේ කාර්යභාරයෙහි වෙනස්කම් සහ සමානකම් පිළිබඳ සැසඳීමක් කරන්න. (ලකුණු 20)

7. (i) ජර්මනියේ 'සොල්වරීනයෙහි' (Zollverein) ප්‍රධාන ලක්‍ෂණ පැහැදිලි කරන්න . (ලකුණු 06)

(ii) 19 වන ශත වර්ෂයේ ජර්මනියේ අභ්‍යන්තර වෙළඳාමේ ප්‍රසාරණය මගින් ආර්ථික සංවර්ධනය සිදු කිරීම සඳහා සොල්වරීනයෙහි මූලික දායකත්වයන් සාකච්ජා කරන්න . (ලකුණු 14)

8. පහත ඒවායින් ඕනෑම **හතරක්** පිළිබඳව කෙටි සටහන් ලියන්න

(i) දෙවන කොටු කිරීමේ ව්‍යාපාරය

(ii) යුධ කොමියුනිස්ට්වාදය

(iii) සෝවියට් රුසියාවේ නව ආර්ථික ප්‍රතිපත්ති

(iv) වර්‍ෂ 1815 ධාන්‍ය නීති

(v) වාණිජවාදය (Mercantilism)

(4 × 5 = ලකුණු 20)

**************************

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය - පේරාදෙණිය විශ්වවිද්‍යාලය
தொடர் தொலைக் கல்வி நிலையம் - பேராதனைப் பல்கலைக்கழகம்
CENTRE FOR DISTANCE & CONTINUING EDUCATION – UNIVERSITY OF PERADENIYA

## ශාස්ත්‍රවේදි සාමාන්‍ය උපාධි පරීක්ෂණය (අගෝස්තු - 2016)

### ආර්ථික විද්‍යාව 111
### ECG 3 ව්‍යවහාර ආර්ථික විද්‍යාව

ඕනෑම ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 10කි.
සෑම ප්‍රශ්නයකටම දෙනු ලබන ලකුණු සංඛ්‍යාව එයට අදාළව දක්වා ඇත.
(කාලය පැය තුනයි)

1. (i). ශ්‍රී ලංකාවේ 1977 පෙර ආර්ථික ප්‍රතිපත්තියෙන් 1977 පසු ආර්ථික ප්‍රතිපත්තිය වෙනස් වන්නේ කුමන ක්‍රමවලින්ද? කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

   (ii). 'නිදහසේ සිට, ශ්‍රී ලංකා රජය සුභසාධන රාජ්‍යයක් ලෙස කටයුතු කරයි.' ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නේද? අදහස් දක්වන්න. (ලකුණු 10)

2. (i). දරිද්‍රතාව යන්න නිර්වචනය කරන්න. (ලකුණු 04)

   (ii). ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව සඳහා හේතු කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

   (iii). '1990 සිට ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව අඩු වෙමින් පවතී.' ප්‍රකාශය සමඟ එකඟ වන්නේද? පැහැදිලි කරන්න. (ලකුණු 08)

3. ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රතිපත්ති ක්‍රම යටතේ ආර්ථිකයේ වර්ධනය වීම් විභාග කරන්න. (ලකුණු 20)

4. (i). (a). 1977 පෙර ආනයන ආදේශනය සහ
   (b). 1977 පසු අපනයන ප්‍රවර්ධනය
   යටතේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන කාර්මීකරණ උපාය මාර්ග විස්තර කරන්න. (ලකුණු 10)

   (ii). විදේශ විනිමය ඉතිරි කිරීම්/ඉපැයීම්වලට සහ ආර්ථිකය කාර්මික වීමට අදාළව ආනයන ආදේශනයෙහි සහ අපනයන ප්‍රවර්ධනයෙහි ප්‍රතිඵල සංසන්දනය කරන්න. (ලකුණු 10)

5. (i). පසු ගිය දශක හතර තුළ ශ්‍රී ලංකාවේ ජනගහන වර්ධනය අඩු වීම සඳහා හේතු විස්තර කරන්න. (ලකුණු 10)

   (ii). නිදහසේ සිට ශ්‍රී ලංකාවේ ජනගහන වර්ධනයෙහි ආර්ථික බලපෑම් විභාග කරන්න. (ලකුණු 10)

6. (i). ශ්‍රී ලංකාවේ සේවා වියුක්ති ප්‍රශ්නයෙහි ප්‍රධාන ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 10)

   (ii). ශ්‍රී ලංකාවේ සේවා වියුක්ති ප්‍රශ්නය අඩු කිරීමේ ක්‍රම යෝජනා කරන්න. (ලකුණු 10)

7. (i). ශ්‍රී ලංකාවේ කෘෂි කාර්මික ඵලදායිතාව වැඩි කිරීමට රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මොනවාද? (ලකුණු 14)

(ii). ශ්‍රී ලංකාවේ කෘෂි කාර්මික අංශය මත මෙම ප්‍රතිපත්තිවල බලපෑම පැහැදිලි කරන්න. (ලකුණු 06)

8. (i). ශ්‍රී ලංකාවේ අයවැය හිඟය පියවීම සඳහා රජයේ ආදායම මදි වීමට හේතු දක්වන්න. (ලකුණු 06)

(ii). ශ්‍රී ලංකාවේ රාජ්‍ය වියදම් දිගින් දිගටම ඉහළ යාමට හේතු මොනවාද? (ලකුණු 07)

(iii). ශ්‍රී ලංකාවේ ආර්ථිකය මත අයවැය හිඟයෙහි බලපෑම් සාකච්ඡා කරන්න. (ලකුණු 07)

9. 1977න් පසු ආර්ථික ප්‍රතිසංස්කරණ ශ්‍රී ලංකාවේ පහත අංශවල ඇති කළ ප්‍රතිඵල ඉදිරිපත් කර පැහැදිලි කරන්න.

(a). අපනයන සහ ආනයන ව්‍යුහය
(b). ගෙවුම් ශේෂය
(c). විදේශ වෙළෙඳ අනුපාතය
(d). විදේශීය සෘජු ආයෝජන (එකකට ලකුණු 05 බැගින්)

10. ශ්‍රී ලංකාවට අදාළව පහත ඕනෑම **හතරක්** පිළිබඳ කෙටි සටහන් ලියන්න. (එකකට ලකුණු 05 බැගින්)

(a). 1977 සිට විදේශ විනිමය ප්‍රතිපත්තිය
(b). දරිද්‍රතාවයේ සහ ආදායම් විෂමතාවේ මිනුම්
(c). උපත් අනුපාතිකය තීරණය කරන සාධක
(d). විදේශීය සෘජු ආයෝජන තීරණය කරන සාධක
(e). බදු ආදායම්වල සංයුතිය
(f). නිරපේක්ෂ දරිද්‍රතාව සහ සාපේක්ෂ දරිද්‍රතාව